ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන

# ගෙවතු වගා ප්‍රවර්ධන වැඩසටහන - 2016

## ගෙවතු සැලසුම් සැකසීම සඳහා උපදෙස්




කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

කෘෂිකර්ම අමාත්‍යාංශය

## ගෙවතු වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය

ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන යටතේ ගෙවතු පන් ලක්ෂයක් සංවර්ධනය කිරීම ඉලක්ක කර ගනිමින් ගෙවතු වගා ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

මෙම ගෙවතු ආහාර බෝග මගින් භූමි අලංකරණ සැලැස්මක් පදනම් කරගෙන සිදුකරන බැවින් ගෙවත්තේ භූමිය ඵලදායී ලෙස භාවිතය තුළින් පවුලේ ආහාර හා පෝෂණ සුරක්ෂිතතාව ඇතිකිරීමට අමතරව පරිසරයේ අලංකාරය සුරැකීම ද අපේක්ෂා කෙරේ.

ප්‍රතිලාභී ගෙවතු සැලසුම් සැකසීම හා ගෙවතු සංවර්ධනයේදී උපයෝගි කරගැනීම සඳහා මූලික මඟපෙන්වීමක් මෙම පත්‍රිකාව තුළින් අපේක්ෂා කෙරේ.

| | කාර්යය | වගකීම |
|---|---|---|
| 01 | කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් දැනුවත් කිරීම සඳහා පුහුණු පැවැත්වීම | සංවිධානය - ගොවිජන සංවර්ධන නිලධාරි<br>සම්පත් දායකත්වය කෘෂිකර්ම උපදේශක |
| 02 | ප්‍රජාව දැනුවත්කර ගම්මානයකට ප්‍රතිලාභී කාන්තාවන් 20 දෙනෙකු තෝරා ගැනීම<br><br>මේ සඳහා දැනට පවතින කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති සංවිධානයක සාමාජිකයන් තෝරාගැනීම හෝ එසේ නොවන ගම්මාන සඳහා නව සංවිධානයක් පිහිටුවා ගැනීම කළ යුතුය<br><br>ප්‍රතිලාභී කාන්තාවන් තෝරා ගැනීමේදී පහත කරුණු පිළිබඳ සැලකිලිමත් වන්න<br>- ගෙවතු වගාව සඳහා සුදුසු හා ප්‍රමාණවත් තරම් භූමියක් සතුවීම<br>- ස්ථිර ජල ප්‍රභවයක් තිබීම<br>- ගෙවත්ත සංවර්ධනය කිරීම හා දිගු කාලීනව පවත්වාගෙන යාම සඳහා උවමනාවක් හා උනන්දුවක් ඇති අයෙකු වීම<br>- පුහුණු වැඩසටහන් සඳහා සහභාගිවීමට හැකිවීම<br>- අසල්වාසීන් ගෙවතු වගාව කෙරෙහි උනන්දුවක් ඇතිකරවන සේ ආදර්ශමත් ගෙවත්තක් ලෙස පවත්වාගෙන යාමට හැකියාවක් ඇති අයෙකු වීම | කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර<br><br>(මෙය කෘෂිකර්ම උපදේශක, කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර, ගොවි සංවිධාන නියෝජිත කමිටුවකින් සිදුකිරීම වඩාත් සුදුසුයි) |

| | | |
|---|---|---|
| 03 | එම ප්‍රතිලාභී කාන්තාවන් 20 රැස්කර සමිතියක් පිහිටුවා ගැනීම | කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර<br>කෘෂිකර්ම උපදේශක |
| 04 | සමිති සාමාජිකයන් සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය | සංවිධානය - කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර<br>සම්පත් දායකත්වය කෘෂිකර්ම උපදේශක |
| 05 | සමිතියේ තෝරාගත් සාමාජිකයෙකු හරහා කණ්ඩායමට අවශ්‍ය තවාන් කළ යුතු එළවළු බෝග වර්ග 2ක තවාන් පැළ නිපදවීම හා විධිමත්ව බෙදා හැරීම | ක්‍රියාත්මක කිරීම කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර<br>තාක්ෂණික උපදෙස් කෘෂිකර්ම උපදේශක |
| 06 | ප්‍රතිලාභී ගෙවතු සඳහා සැලසුම් සැකසීම (ආහාර බෝග මගින් භූමි අලංකරණ සහිතව) | |
| 07 | ප්‍රතිලාභී පවුල් වෙත ලබාදෙන පලතුරු පැළ විධිමත්ව බෙදාහැරීම<br>එක් ගෘහයක් සඳහා<br>- පලතුරු පැළ 5 ක්<br>- කෙලින්ම ක්ෂේත්‍රයේ සිටුවිය හැකි එළවළු බෝග බීජ වර්ග 6 ක් සහිත බීජ කට්ටලයක් | |
| 08 | ලබාදෙන බීජ වර්ග සති 2 ක් තුලදී සිටුවා අවසන් කිරීම සඳහා සැලසුම් කිරීම<br>පැළවීම පිළිබඳ ගැටළු ඇත්නම් (බීජ ලබාදී සතියක් තුළ) කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත වහාම දැනුම් දීමට කටයුතු කරන්න (දුරකථන අංකය 071-4454113)<br>තවාන් පැළ බෙදා හැරීමට පෙර ප්‍රතිලාභී ගෙවතුවල වලවල් හෝ පාත්ති සකසා අවසන් කර තිබීමට උපදෙස් ලබාදීම<br>ගෙවතු තරඟ පැවැත්වීමට අපේක්ෂා කරන බැවින් ඒ පිළිබඳව දැනුවත් කිරීම | කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර |
| 09 | ගෙවත්තේ එළවළු, පලතුරු බෝග නඩත්තු කිරීම, රෝග සහ පලිබෝධ පාලනය, ස්වයං බීජ නිෂ්පාදනය, පලතුරු බෝග කප්පාදුව යනාදිය පිළිබඳ අවශ්‍ය උපදෙස් ලබාදීම හා පසු විපරම | කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර<br>කෘෂිකර්ම උපදේශක |

# ආහාර බෝග මගින් භූමි අලංකරණය සහිතව ගෙවත්ත සැලසුම් කිරීම සඳහා උපදෙස්

## 1. ගෙවත්තේ වටපිටාව හොඳින් නිරීක්ෂණය කිරීම

(අ) විවිධ කෝණ ඔස්සේ ඇස් මට්ටමින් පමණක් නොව පොළොව මට්ටමින් ගෙවත්ත නිරීක්ෂණය කරන්න.

ගෙවත්තට ඇතුල්වන ස්ථානය, වැට, මායිම්, ගෙමිදුල, ගෙවත්ත පිටුපස පෙදෙස, කුණු දමන ස්ථාන, ළිඳ/ ජල ප්‍රභවය, ජල නල මාර්ග, විදුලි රැහැන් වැනි කරුණු

(ආ) භූමි සාධක හඳුනාගැනීම


භූමියේ පිහිටීම, පසේ ස්වභාවය, ජල වහනය, සුළං හමන දිශාව, හිරු එළිය වැටෙන දිශාව හා කාල සීමාව, අධික සෙවන සහිත ස්ථාන, දිය අගල්, ගල් බොරළු සහිත ස්ථාන, දිය සීරාව සහිත ස්ථාන, බහුවාර්ෂික ශාකවල පිහිටීම වැනි විවිධ සාධක හා එයට අනුකූල කලාප හඳුනාගන්න.

## 2. සැලැස්මක් සකස් කිරීම

*ක්‍රමය 1*

**පරිමාණයකට අනුව ගෙවත්තේ සැලසුම නිර්මාණය කිරීම**


- නිවස, ස්ථිර ගොඩනැගිලි (වැසිකිලිය, දරමඩුව, ගව මඩුව, කුකුල් කොටුව), ළිඳ, වැට මායිම් පිහිටීම කඩදාසියක සලකුණු කරගන්න.
- වැට හා එම ගොඩනැගිලි අතර දුරවල් ටේප් පටියක් හෝ ලණුවක් හා කෝදුවක් භාවිතා කර මැන ගන්න.
- මෙම තොරතුරු කොටුරූල් කොලයක පරිමාණයකට අනුව සලකුණු කරගන්න.




උදාහරණයක් ලෙස පරිමාණයකට ඇඳීමේදී ගෙවත්තේ අඩි 5ක දිගක් සැලැස්මේ එක් කොටුවකින් පෙන්නුම් කළ හැක.

ඉහත නිරීක්ෂණ අනුව ගෙවත්තේ විවිධ ස්ථාන එනම් නිවස ඉදිරිපස, ගෙවත්තේ වතුර රැඳී පවතින

ස්ථාන, බහු වාර්ෂික ගස් සහිත, සෙවන සහිත ස්ථාන, හොඳින් හිරුඑළිය වැටෙන ස්ථාන වැනි හඳුනාගත් ස්ථාන සඳහා සුදුසු බෝග ඇතුලත් කරමින් ගෙවත්ත සඳහා සම්පූර්ණ සැලැස්මක් ඇඳ ගන්න.




ක්‍රමය 2

**පරිගණකය ආශ්‍රිතව ගෙවතු සැලසුම් කිරීම. (පහසුකම් පවතීනම්)**

- ගෙවත්තේ සියළු ස්ථාන කොටස් වශයෙන් ඡායාරූප ගත කරන්න. උදාහරණ නිවස ඉදිරිපස, ඉදිරිපස වැට මායිම වැනි...
- ඒ ඒ කොටස් වලට ගැලපෙන ලෙස බෝග ඇතුලත් කරමින් පරිගණක මෘදුකාංග භාවිතා කර සැලසුම නිර්මාණය කරන්න

**පවතින තත්වය** | **සංවර්ධනය කළ යුතු තත්ත්වය**





*දිය අගලක් සහිත තැනක්*





*විශාල ගස් සහිත තැනක්*


ක්‍රමය 3

### ඡායාරූප ඇසුරින් ගෙවතු සැලසුම නිර්මාණය

- ගෙවත්තේ සියළු ස්ථාන/ කොටස් ඡායාරූප ගත කරන්න
- එක් එක් කොටසේ ඡායාරූපය පරිගණකය ඇසුරින් A4 ප්‍රමාණයේ කොලයක මුද්‍රණය කර ගන්න
- මුද්‍රණය කළ ඡායාරූපය මත බෝග සහිත භූමි අලංකරණ සැලසුම අතින් ඇඳ ගන්න.



කලු සුදු ඡායාරූප පිටපත




සැලසුම

### ගෙවතු සැලසුම්කරණය සඳහා යොදාගත හැකි ආහාර බෝග මඟින් කළ හැකි විවිධ භූමි අලංකරණ ක්‍රම

- බෝග මඟින් වැට හා වැටි නිර්මාණය





- විවිධ හැඩතල සහිත පාත්ති සැකසීම (රවුම්, ජ්‍යාමිතික හැඩතල, අවිධිමත් හැඩතල)





- ඉඩකඩ අඩු ගෙවතු සඳහා විවිධ ව්‍යුහ (වගා කුළුණු, වගා පිරමිඩ, බඳුන් වගාව, එල්ලෙන බඳුන් යනාදිය)





- සිරස් ඉඩ භාවිතා කළ හැකි වගා ක්‍රම (පන්දලම්, ආරුක්කු, වගා කුළුණු)





- විවිධ වර්ණ සංයෝජන සහිත බෝග වර්ග යොදා ගැනීම
- පොල් ලෙලි, ගල් වැටි, උළු කැට, උණ බම්බු වැනි සුලබව ලබා ගත හැකි දෑ භාවිතා කර ගෙවත්තේ එක් එක් කොටස් වෙන් කිරීම හා කුඩා ගමන් මාර්ග සෑදීම
- සුදුසු ස්ථාන සඳහා පොකුණු, දියඇලි, බෝග මඟින් අලංකාර වූ ගිම්හාන කුටි වැනි දෑ සැලසුම් කර ගන්න
- භූමියේ ස්වභාවය හා ජලවහනය අනුව සුදුසු පාත්ති ක්‍රම යොදන්න (ගිල්වූ පාත්ති, උස්වූ පාත්ති)
- ඉඩකඩ අඩු ගෙවතු සඳහා බඳුන් වල එළවළු, පලතුරු වගාව
- ජල රෝපිත වගා ක්‍රම


සෑම ගෙවත්තක් සඳහාම කාබනික පොහොර සැකසීමේ ඒකකයක් අනිවාර්යයෙන්ම පිහිටුවීමට කටයුතු කරන්න.

ගෙවත්තේ පිහිටීම අනුව සුදුසු පාංශු සංරක්ෂණ ක්‍රම ඇතුලත් කරන්න. (ගල් වැටි/ සෝල්ට් වැටි/ පස් වැටි/ කාණු වැනි...)


# එළවළු තවාන් පැළ සැකසීම

## 01 උස් පාත්ති තවාන් වල එළවළු පැළ නිපදවීම

- හොඳින් හිරුඑළිය වැටෙන මනාව ජලය බැස යන තැනක් තවාන සඳහා තෝරා ගන්න
- සෙ.මී. 15 (අඟල් 4) ක් පමණ උසට, මීටර් 1 ක් පමණ පළලට තමන්ට අවශ්‍ය ප්‍රමාණයේ දිග සිටින සේ උස් පාත්තියක් සකසා ගන්න (රූපය 01)
- පස් කැට පොඩිකර සියුම්ව සකසන්න
- හලාගත් මතුපිට පස් සහ ගොම හෝ කොම්පෝස්ට් සමාන ප්‍රමාණවලින් මිශ්‍රකර පාත්තිය මත සෙ.මී. 5 ක පමණ තට්ටුවක් වන සේ අතුරන්න (රූපය 02)




(රූපය 01)




(රූපය 02)

### තවාන් පාත්තියේ පස ජීවාණුහරණය කිරීම



(රූපය 03)

**ක්‍රමය 1**

තවාන් පාත්තිය හොඳින් තෙමා සෙ.මී. 5 ක් පමණ ඝනකම පිදුරු තට්ටුවක්ද, ඉන්පසු සෙ.මී. 5 ක් පමණ ඝනකම දහයියා තට්ටුවක්ද වශයෙන් මාරුවෙන් මාරුවට තට්ටු 4 ක් පමන අතුරන්න. මතුපිට තිබිය යුත්තේ දහයියා තට්ටුවකි. (රූපය 03)

සුලං හමන දිශාවට විරුද්ධ දෙසින් ගිනි තබන්න. තවාන නිවුන පසු මතුපිට ඇති අළු ප්‍රවේශමෙන් ඉවත් කරන්න.

ක්‍රමය 2

නිර්දේශිත දිලීර නාශකයක් (කැප්ටාන්, තිරාම්, හෝමායි වැනි) ජලයේ දියකර තවාන් පාත්තිය හොඳින් තෙමෙන සේ මල් බාල්දියකින් යොදන්න. මේ සඳහා දිලීරනාශක පැකැට්ටුවේ අඩංගු නිර්දේශ අනුගමනය කළ යුතුය.

ජීවාණුහරණය කළ පසු පාත්තියේ පස නැවත මිශ්‍ර කිරීම හෝ නැවත ගොම හෝ කොම්පෝස්ට් යනාදිය යෙදීම නොකරන්න.

**තවානට බීජ දැමීම**

රීප්ප පටියක් ආධාරයෙන් සෙ.මී. 10-15 පරතරයට නොගැඹුරු කුඩා ඇලි සලකුණු කරන්න. එම ඇලි දිගේ තුනීවට බීජ දමා එම පාත්තියේ පස් වලින්ම වසා පිදුරු හෝ තෙත ගෝනියකින් වසුනක් යොදන්න.

## 02 බඳුන් තවාන් වල පැළ නිපදවීම

එක් බඳුනක (පොල්කටු, පොලිතීන්, කෙසෙල් පට්ටා, යෝගට් කෝප්ප වැනි) එක් පැළයක් බැගින් හෝ සමූහ බඳුන් (කිරි හට්ටි, ඉවතලන අයිස් ක්‍රීම් භාජන) භාවිතා කළ හැක.


*පොල් කටු බඳුන්*


*කෙසෙල් පට්ටා බඳුන්*


*යෝගට් කෝප්ප බඳුන්*


*කිරි හට්ටි බඳුන්*


*අයිස් ක්‍රීම් බඳුන්*


*පොලිතීන් බෑග්*

ජලවහනය හොඳින් සිදුවීමට බඳුන් පුරවා ගැනීමට පෙර මේවායේ සිදුරු සකසා ගැනීම අත්‍යාවශ්‍ය වේ.

**බඳුන් මිශ්‍රණය**

මතුපිට පස සහ කොම්පෝස්ට් හෝ වියළි ගොම සල්ලඩයකින් හෝ දැල් ගෝනියකින් හලාගෙන සම ප්‍රමාණ මිශ්‍ර කර බඳුන් මිශ්‍රණය සකසාගන්න.

බඳුන් මිශ්‍රණය ජීවාණුහරනය සඳහා සුදුසු ක්‍රම දෙකක් පහත සඳන්වේ.

අ. ජල වාෂ්පයෙන් විනාඩි 20 ක් පමණ හොඳින් තම්බා ගැනීම (වාෂ්පයෙන් වී තැම්බීම සිදුකරන බැරලය මේ සඳහා යොදාගත හැකිය.)

ආ. පස් මිශ්‍රණයෙන් බඳුන් පුරවා ගත් පසු නිර්දේශිත දිලීර නාශකයක් ජලයේ දියකර පස් මිශ්‍රණය හොඳින් තෙමෙන සේ වත්කරගැනීම.

## සියළුම තවාන් ක්‍රමවලදී අනුගමනය කළ යුතු නඩත්තු කටයුතු

- දිනපතා අවශ්‍ය පරිදි පමණක් ජලය සපයන්න
- බීජ පැළවීගෙන එන විට වසුන ඉවත් කරන්න

**තවානේ බීජ පැළවීමට ගත වන කාලය**

| | |
|---|---|
| මාළු මිරිස්, මිරිස්, බටු | දින 7-10 |
| තක්කාලි, ගෝවා, නෝකෝල්, බීට් | දින 4-5 |

- තද හිරු එළියෙන්, වර්ෂාවෙන් පැළ ආරක්ෂාකර ගැනීම සඳහා ආවරණ සැළසුම් කර ගන්න



| බෝගය | තවාන් කාලය |
|---|---|
| මාළු මිරිස්, මිරිස්, බටු, ගෝවා, නෝකෝල් | සති 3-4 |
| තක්කාලි, සලාද | සති 2-3 පමණ |
| බීට් | සති 4-6 |

පැළ සිටුවීමට සුදුසු අවස්ථාවට පත් වූ පසුව, තවාන හොඳින් ජලයෙන් තෙත් කර, මුල නොකැඩෙන ලෙස හා කඳ නොතැලෙන ලෙස පැළ ගලවා ගන්න. තනි බඳුන් ක්‍රමයේදී බඳුන ප්‍රවේශමෙන් ඉවත්කර මාධ්‍ය සමඟම පැළය සිටුවා ගන්න.

## එළවළු පැළ/ බීජ සිටුවීමට අදාල උපදෙස්

- එළවළු බෝග සඳහා හොඳින් හිරුඑළිය වැටෙන ස්ථාන තේරීම
- හොඳින් බිම සකස් කර පාත්ති හෝ පැළ සිටුවන වලවල් නිර්දේශිත පරතරයට සැකසීම
- සකසාගත් වලවල් හෝ පාත්ති වලට හොඳින් දිරූ කාබනික පොහොර එකතු කර හොඳින් මිශ්‍ර කිරීම.

- කාබනික පොහොර යොදා දින කිහිපයකට පසු පැළ හෝ බීජ සිටුවීම

එළවළු තවාන් පැළ බෙදා හැරීමට පෙර ඉහත කාර්යයන් අවසන් කළ යුතුය

- තවාන් පැළ සිටුවීමේදී සුදුසු වයසැති හොඳින් වැඩුනු පැළ තෝරා ගැනීම
- තවාන් පැළ මුල් වලට හානි නොවන ලෙස ගලවා ගෙන වියළී නොයන ලෙස වගා බිම් වලට ගෙනයාමට කටයුතු කිරීම
- පැළ සිටුවා සෙවන කිරීම, ජලය යෙදීම, නිරන්තර පරීක්ෂාව හා රෝග පලිබෝධ හානි පාලනය සඳහා කටයුතු කිරීම

එළවළු බෝගවල කරල්/ ගෙඩි හටගත් පසුව, දෙවන හෝ තුන්වන අස්වනු වාරවල කරල් හෝ ගෙඩි කීපයක් හොඳින් මේරීමට හෝ වියළීමට හැර ඊළඟ කන්නයේ බීජ සඳහා භාවිතයට උපදෙස් ලබාදෙන්න.

## පලතුරු පැළයක් සිටුවීම

- අන්නාසි හැර අනිකුත් පලතුරු බෝග සඳහා වලක ප්‍රමාණය දිග, පළල, උස සෙ.මී. 60x සෙ.මී. 60x සෙ.මී. 60 වේ. ඉතා තද පසක නම් වලේ ප්‍රමාණය විශාල කරන්න.
- පැළ සිටුවීමට සති 2කට පමණ පෙර හොඳින් දිරාපත් වූ ගොම පොහොර හෝ කොම්පෝස්ට් කිලෝ ග්‍රෑම් 10ක්, මතුපිට පස් සමඟ මිශ්‍රකර වලවල් පුරවාගන්න.
- පැළය පොලිතීන් උරයක සිටුවා තිබේනම් කුඩා පිහියක් ආධාරයෙන් උරය ප්‍රවේශමෙන් ඉවත්කර, සකස්කර ඇති වලේ හරිමැද, මුල්වලට හානියක් නොවන සේ සිටුවන්න.
- පොලිතීන් බඳුනේ තිබූ පස් මට්ටමට වඩා පැළය ගැඹුරු නොකරන්න.
- හොඳින් පස් දමා තදකළ පසු පැළයට ජලය යොදන්න.
- සිටුවන ලද පැළය ඍජුව වර්ධනය වීමට ඉඩ සැලසීම හා පැළය සෙලවීමෙන් මූල මණ්ඩලයට හානි සිදුවීම වළක්වා ගැනීමට, පැළයට ආධාරකයක් සපයන්න.

- ස්ථිර බිමෙහි සිටුවන සමහර පලතුරු පැළ වලට (මැංගුස්, දූරියන්, රඹුටන් ආදී) පැළ සිටවූ විගසම සෙවන සැපයීම වැදගත් වේ. මේ සඳහා පොල්අතු හෝ සෙවන දැල් භාවිතා කළ හැක.
- සෙවන සැපයීම, පැළය වර්ධනය වීමත් සමඟ ක්‍රමානුකූලව ඉවත්කළ හැක.
- ගෙවත්තක පලතුරු ගස් සඳහා මාස 6කට වරක් කි.ග්‍රෑ. 10 බැගින් කාබනික පොහොර යෙදීම සුදුසුය.
- බද්ධ පැළවල ග්‍රාහකයෙන් එන රිකිලි ඉවත් කරන්න.
- පලතුරු පැළ වර්ගය අනුව සුදුසු ක්‍රමවේදයකට පැළ පුහුණු කිරීම හා නඩත්තු කටයුතු කරන්න.

**බඳුන් සකස්කර ගැනීමේදී,**

- ඉඩකඩ අඩු ගෙවත්තකට විශාල බඳුන් (ධාරිතාවය ලීටර් 35-50 පමණ වන) තුල පලතුරු පැළ සිටුවා ගත හැක.
- බඳුනේ පතුලේ හා පතුලට අඟල් 2-3 ක් ඉහලින් ජල වහනය පහසු කරවීමට 1" ප්‍රමාණයේ සිදුරු 10-12 ක් සාදා ගන්න.
- බඳුනේ පතුලට අඟල් 3-4 ප්‍රමාණයේ ගඩොල්/ උළු කැබලි තට්ටුවක් යොදන්න
- ඉන්පසු බඳුන, බඳුන් මිශ්‍රණයෙන් (මතුපිට පස්: වැලි: ගොම හෝ කොම්පෝස්ට් 1:1:1 අනුපාතයට) පුරවා සුදුසු පලතුරු පැළයක් සිටුවා ගන්න

# සටහන්